


## මහා ව්‍යසනයක ආරම්භය..?

අපි ජතිවාදයේ භයංකාර බව ඉතා හොඳින් අත් දැක ගත් රටක සිට මෙරටට සංක්‍රමණය වූ මිනිස්සු වෙමු. ඒ නිසාම එවන් පටු ව්‍යාපාර නිසා සිදුවිය හැකි අනතුර අපට වෙන කාටවත් වඩා හොඳින් අවබෝධ කර ගත හැකි ය.

පසුගිය දින කීපයේ ඔස්ට්‍රේලියාවේ සමහර ප්‍රදේශ වල හිස ඔසවමින් එන ජාතිවාදී ස්වරූපයේ ගැටුම් අපේ සිත තුළ ඇති කරන්නේ බයකි. මේ අමන මිනිසුන් මේ සුන්දර රට ඇදගෙන යන්නට තැත් කරන්නේ මහා ව්‍යසනයකට බව අපට හොඳින් පෙනෙයි. මෙවන් පටු ව්‍යාපාර ආරම්භයේදීම නවතා දමන්නට කටයුතු කිරීම බුද්ධිමත් රජයක වගකීම වෙයි.

ඒ වගකීම මේ රජය හරියාකාරව තේරුම් ගන ඇද්ද යන්න ගැටලුවකි.


ශ්‍රී ලාංකික
ඇට මිදුළු
දායක ලේඛණයේ
ලියාපදිංචි
දායකයින් ගණන




ඇට මිදුළු/සම්භව සෛල
දායකයකු ලෙස ලියාපදිංචි වන්න

ජීවිතයක් කොයි තරම් වටිනවද..?

ශ්‍රී ලාංකික ප්‍රජාවේ සාමූහික ප්‍රයත්නයක්


ඒ ශ්‍රී ලංකාවේ තවත් නිදහස් දිනයක් ආසන්නයේ දවසක්. නිදහස් දිනය නිමිති කරගෙන හොඳ 'ආටිකල්', එකක් කරන්නැයි කියලා මට කර්තෘතුමා වගකීමක් පැවරුවා. ඒ සඳහා සාකච්ඡා කරන්න හොඳ පැවිදි පඬිරුවනක් ගැන මම කල්පනා කළා. ඊට පස්සේ මම කතා කළේ කෝට්ටේ ශ්‍රී නාග විහාරාධිපති පූජ්‍ය මාදුළුවාවේ සෝභිත ස්වාමීන්ද්‍රයන් වහන්සේටයි. උන්වහන්සේ නියම කළ වේලාවට නාග විහාරයට පැමිණ සෝභිත ස්වාමීන් වහන්සේ මුන ගැහුණා.

''නිදහස ගැන නේද මහත්තයෝ දැන ගන්න ඕනේ?'' සුපුරුදු ගැඹුරු හඬින් උන්වහන්සේ මගෙන් ඇසුවා.



### කතා සාප්පු වහමු
# සංවර්ධනය අරඹමු

''එහෙමයි අපේ හාමුදුරුවනේ.....?'' මම පිළිතුරු දුන්නා. මෙතැන් සිට ලියැවෙන්නේ උන්වහන්සේ නිදහස ගැන පැවසූ කාරණාවන්ය. මට මතක තිබෙන පරිදි එය ලියැවෙන බව සලකන්න.

''නිදහස කියලා එකක් නම් අවුරුද්දකට සැරයක් එනවා තමයි. එදාටත් කරන්නේ බලයේ ඉන්නේ ඇත්තොයි විපක්ෂයේ ඇත්තොයි ඒ අයගේ පක්ෂවල පාට කොඩි දාලා අහිංසක දුප්පත් රටවැසියන්ව ගොනාට අන්දවන එකනේ. අපිට ඇත්තටම නිදහසක් තියෙනවද? සුද්දා දුන්න නිදහස කියලා එකක් ගැන නම් මමත් අහලා තියෙනවා. ඒත් ඒකෙන් ප්‍රයෝජනයක් තියෙනවාද? දුප්පත් රට වැසියන්ට පලක් තියෙනවාද?

''දැන් බලන්න මේ රටේ තියෙන ප්‍රශ්න කන්දරාව දිහා. හැම ප්‍රශ්නයක්ම එකකට එකක් ගැට ගැහිලා. කොතනින් පටන් අරගෙන කොතනින් විසඳලා ඉවර කරන්නද මේ ප්‍රශ්න කන්දරාව. අවුරුදු ගාණක් තිස්සේ යුද්දේ. සිංහල හමුදාවේ සිංහල තරුණයනුයි, එල්.ටී.ටී.ඊ. හමුදාවේ දෙමළ තරුණයනුයි එකාපිට එකා මේ යුද්දේ නිසා මැරිලා වැටෙනවා. අත පය විනාශ වෙලා. තවත් දහස් ගණනක් සදාකාලිකවම ඔත්පොල වෙනවා. ඒ උදවියගෙන් යැපුන ලක්ෂ ගාණක් අදත් අනාථ වෙලා. අසරණ වෙලා. ඒ උදවියට සමාජයේ හවුහරණක් නැතුව ගිහිල්ලා.

''තරුණ තරුණියන්ට රස්සාවල් නැහැ. ඉගෙන ගත්තත් නෑ. ඉගෙන නොගත් අයටත් නෑ. රස්සාවල් නැතුව කී දාහක් මේ රටේ තරුණ තරුණියන් ඉන්නවද? මහත්තයෝ ඔය අනුරාධපුරේ, පොළොන්නරුවේ වැව්වල තියෙන නෙලුම් අල හාරලා ටින්වල අසුරලා පිටරට ඇරියත් කොපමණ රස්සාවල් දෙන්න පුළුවන්ද? බලන්න වට්ටක්කා වාරෙට ගොවීන්ට විකුණා ගන්න බැරුව වට්ටක්කා කුණුවෙලා යනවා. තක්කාලි, දෙහි, පතෝල, මිරිස්.... ඔය හැම භෝගයක්ම වාරෙදි කුණු වෙනවා. අවාරෙදි ගිනි ගණන්වලට විකිණෙනවා. නිසි වැඩපිළිවෙළක් නැති නිසා නේද මෙහෙම වෙන්නේ.

රස්සා නැති තරුණියෝ මහන්න යනවා. තවත් තරුණියන් සහ මව්වරුන් මැදපෙරදිග වහල් සේවයට යනවා. තරුණයෝ යුද්දෙට ගිහින් මරුට බිලිවෙනවා. නැත්නම් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා ජීවිතේ විනාශ කර ගන්නවා. මව්වරුන් මැදපෙරදිග යාම නිසා දරුවන්ට මව් සෙනෙහස, මව්කිරි ටික අහිමි වෙලා. මහන්නත් බැරි, රට යන්න සල්ලිත් නැති සමහර තරුණියන් ගණිකා වෘත්තියට යොමු වෙලා.

''මේ රටේ අධ්‍යාපනයත් විනාශයි. අධ්‍යාපනයට ප්‍රතිපත්තියක් නැහැ. ප්‍රතිපත්ති හදන්නේ අධ්‍යාපන ඇමැති. එයා බලයේ ඉන්න කල් ඒ ප්‍රතිපත්ති හරි. එයා පැරදුනාට පස්සේ එන්නේ වෙනත් අධ්‍යාපන ඇමැති කෙනෙක්. එයා හදනවා එයාට ගැලපෙන ප්‍රතිපත්ති. ආණ්ඩුවෙන් ආණ්ඩුවට මාරු වන ප්‍රතිපත්ති ක්‍රමයක් ඇතුළේ ලක්ෂ ගණන් පාසල් දරුවෝ නන්නත්තාර වෙලා.

''අධ්‍යාපනය විතරක්ද? සෞඛ්‍ය, ප්‍රවාහන, කෘෂි කර්මය, වාරිමාර්ග, ආරක්ෂාව ඇතුළු හැම වැදගත් විෂයකටම අපේ රටේ ජාතික

**අනුර හොරේෂස්**

ප්‍රතිපත්තියක් නෑ. එක්කෝ නිල් ප්‍රතිපත්ති. නැත්නම් කොළ ප්‍රතිපත්ති. මේ නිසා රට පුරා වැඩ වර්ජන. පාසල් වර්ජන. ශිෂ්‍ය අරගල. බස් දුවන්නේ නෑ. රෝහල්වල දොස්තරලගේ වර්ජනය ඉවර වෙන කොටම හෙදියෝ පටන් ගන්නවා. හෙදියන්ගේ වර්ජනය ඉවර වෙද්දිම තවත් වර්ජනයක්. නැත්නම් විදුලිය වර්ජනයක් හරි ඇවිත් විදුලිය කපා දමනවා.

4 වන පිටට




**සංස්කරණය**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සම්බන්ධීකරණය**

| | |
|---|---|
| **NSW** Lakshman Kodituwakku 02 9626 7660 02 9837 5055 | **WA** Kapila Hemantha Balage 08 9456 1972 |
| **QLD** Ananada Samaratunga 07 3372 7953 | **ACT** Asoka Nimalasiri 0439 925 241 |
| **SA** Chandta Eeriyagama 08 8331 2318 | **TAS** Anura Seneviratne 03 6327 4259 |

**සන්නස පිරිවර**

| | |
|---|---|
| අනුර හොරේෂස් | Anura Horetious |
| සිසිර දිසානායක | Sisira Dissanayaka |
| ශ්‍රීනාත් මද්දුමගේ | Srinath Maddumage |
| අසෝක සුබසිංහ | Asoka Subasinghe |
| සාලිය ගලප්පත්ති | Saliya Galappaththi |
| ඩබ්ලිව් කේ ධර්මබන්ධු | W. K. Dharmabandhu |
| ආචාර්ය විද්‍යානි මනතුංග | Dr Vidyani Manathunga |
| චන්දි මාපා | Chandi Mapa |
| ශ්‍රියාණි මද්දුමගේ | Sriyani Maddumage |
| මහින්ද දිසානායක දිවුල්ගනේ | Mahinda Dissanayaka Diwulgane |


සන්නස පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත


පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe

**බෙදාහැරීම් සභය**
ප්‍රියන්ත පෙරේරා



**Sannasa**
PO Box 172 Reservoir
Vic 3073 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasa@gmail.com
Tel : 03 9310 4196 /0425 720 932
Fax : 03 9310 5569